# හැම තැනම කථාව ආහාර නිෂ්පාදනයයි පරිසරයයි

හැම තැනම දන් ආහාර නිෂ්පාදනය ගැන හා පරිසරය ගැන කථාබහ වැඩිවෙලා. පහුගිය අවුරුදු දහයක් විතර මුලු අවධානයම යොමු වුණේ විවෘත ආර්ථිකය තුලින් බහුජාතික සමාගම් ඇති කරන කාර්මික සංවර්ධනය ගැනයි.

සාමාන්‍ය ආාහාර නිෂ්පාදනය වගේම පරිසරය වර්ධනය කර ගැනීම එක එක සාකච්ඡා ඇති වුණත් බහුජාතික සමාගම තදින් පෙනී හිටියේ සුළු පරිමාණ නිෂ්පාදනයන් අතුගා දමීමේ අදහස සමහයි.

එහි ප්‍රධාන අංගයන් වුණේ සම්ප්‍රදායික ගොවිතැන් විහිළුවක් ලෙස සලකා මායිම්වලට තල්ලු කිරීමයි. දන් එක පාරම මේ අදහස ගැන බරපතල ලෙස හිත යොමුවන්නට පටන් අරන්. සංවර්ධනය ගැනම අළුතෙන් කථා කරන්නට පටන් අරන්.

ඉංදියාව හා චීනය සංවර්ධනය වීමත් සමඟ ආහාර අවශ්‍යතාවය තදින් ඉහළ ගිහින්. ලෝකය හැටියට බැළුවහම මෙය ලොකු වැඩිවීමක්. එම ඉල්ලුමට හරියන්නට ආහාර වැඩි කරන්නට සැලසුම් නොතිබීමත් ප්‍රශ්නයක් වෙලා.

අනෙක් අතට ආහාර වෙනුවට වෙනත් වගාවන්ට යොමු වීමත්, එසේම ආහාරවලින් ඉන්ධන නිපදවීමත් මේ හිඟය වැඩි කරන්නට බලපෑමක් වෙලා.

ඒ වගේම පරිසරය රැකීම සඳහා වියදම් කිරීම ඉතාම අඩු බව එළිවෙලා. පරිසරය රැක ගැනීම දුප්පතුන්ගේ වැඩක් හැටියට සැලකීම ලොකුම ප්‍රශ්නයක්. දුප්පත් ජනතාවගේ පහසුකම් ගැන බැලුවේ නැත්නම් පරිසරය ගැන බණ කථා කිරීමෙන් පලක් නෑ.

කර්මාන්තවලට ආයෝජනය කරන හැම ධනයකටම තවත් ධනයක් පරිසරයට යොදන්න අවශ්‍ය වෙලා. මේ විදියට ලෝක පරිමාණව තීන්දු ගැනීම ගැන දන් අළුත් විදියට කල්පනා කළ යුතු බව දියුණු රටවල පණ්ඩිතයන් පවා කථා කරන්නේ දන් ලෝකයම ලොකු අර්බුදයකට මුහුණ දෙන දෙන නිසයි.

සංවර්ධනයට යොමු වුණ සෑම අවස්ථාවකම ඊළඟට මුහුණ දෙන්නෙ එම සංවර්ධනයෙන්ම බැට කන ජනතාව බව මාක්ස් පෙන්වලා දුන්නේ අවුරුදු 200 විතර ඉස්සෙල්ලා.

මේ වගේම අදහසක් හැරල්ඩ් ජේම්ස් (Harold James) කියල තියෙනව. "

"history is replete with episodes in which international commerce and finance have flourished and generated bursts of economic growth and development, only to be reversed because of popular backlash."

මේ අනුව ආර්ථික වශයෙන් වේගවත් දියුණු හැම අවස්ථාවක්ම ඊළඟට ආපසු හැරවී ඇත්තේ බහුජන නැගිටීම් නිසා.

මේ අනුව ඉංදියාව හා චීනය තුළත් මහජන නැගිටීම් දෙසට යොමු වෙන්නට පුළුවන් බවයි ලොකු බකපණ්ඩිතයින් පවා කියන්නේ.

මේ අනුව මේ ඊනියා සංවර්ධනයේ අසමාන ස්වරූපය හොඳටම එළිදරව් වෙනවා. මේ සංවර්ධනයෙන් අත් වෙන්නේ පහළ තට්ටුව පාගාගෙන ඉහළ තට්ටුවක් ශක්තිමත් වීම හා පොහොසත් වීමයි. ඇති එකා ඇති හැකි වීම සමඟ නැති එකා නැති බැරි වීම අනිවාර්ය ලක්ෂණයක්.

මීට අමතරව මුළු මිනිස් සමාජයම අවලම් සමාජයක් වීමේ ප්‍රශ්නයත් මතුවෙනවා. එය දුප්පතුන්ට විතරක් නෙවෙයි පොහොසතුන්ටත් එක සමානව බලපානවා.

සංවර්ධනය තුළින් මිනිසා ලබා ගන්නේ කුමන වින්දනයක්ද? කුමන සැපක්ද? කුමන සහනයක්ද? මේක ලොකු ප්‍රශ්නයක්.

ඇත්තටම බඩගින්න නිවා ගැනීම, ලෙඩදුක් නැති වීම, ගෙයක් හදා ගැනීම මේවා ඇත්ත උවමනාවන්. බඩගින්න, විඩාව, බිය මේ කාරණා තුන නැතිව දවස ගෙවා ගන්න පුළුවන් වීම ඇත්තටම සංර්ධනයක්.

ඊත් එතැනින් එහාට උවමනාවන් විවිධ විදියට ඇති කරගන්න, මවන්න පුළුවන්. මේ උවමනාවන් තුළින් ජීවිතය සහනශීලී, සාරවත් බවක් අත්පත් කරගන්නවද කියන ප්‍රශ්නය තදින්ම මතු වෙනව.

අද බැළුවහම නූතන තාක්ෂණයෙන් ලැබෙන සහන හැම එකක් සමහම විශාල මර උගුලක් ගෙදරට, නැත්නම් තමන්ටම එකතු වෙනව. මේ උගුල් නිසා ජීවිතය බරක් හා හිඩැසක් වෙන අවස්ථා වැඩි වෙනව.

එනිසා සංවර්ධනය ගැන සදාචාරමය හා අධ්‍යාත්මික සාකච්ඡාවක් අවශ්‍ය වෙනව. තාක්ෂණය වැදගත්. හැබැයි හැම තාක්ෂණයම උවමනාවන් අනුව විවිධ විදියට යොදා ගන්න පුළුවන්. තාක්ෂණයෙන් සහන වැඩිකරනවා වගේම ගැටුම වැඩි කරන්නත් පුළුවන්. පරිසරය හොඳ කරන්නත් පුළුවන්. පරිසරය වඳ කරන්නත් පුළුවන්.

අද ලෝකය පුරාම මේ ගැන විවිධ තලවල කථා ඇති වෙලා. ඒ අනුව දේශපාලන සාකච්ඡාව හැම තැනම මතු වෙලා. වෙනදා දේශපාලනයට යොමු නූන අයත් දන් දේශපාලන කාරණා ගැන හිත යොමු කරලා.

ධනවාදය ක්‍රමයක් හැටියට තවදුරටත් පවත්වගෙන යන්න පුළුවන්ද?, විවෘත ආර්ථිකය වෙනුවට ලෝක පරිමාණව ආණ්ඩු ක්‍රමයක් මගින් මෙහෙයවීමක් ඇති ආර්ථිකයක් ගැන සිතිය යුතුද?, යන ප්‍රශ්නය මාක්ස්වාදීන් නොවන ධනපති විචාරකයන්ම මතු කරන්නට පටන් අරන්.

ලෝක බැංකු පණ්ඩිතයන් දෙන්නෙක් මෙහෙම කියනව.

"In each case, hard decisions, must be made about whose welfare, which rights, and what goals matter most. This makes global governance - whether at pertains to finance, trade, the environment, or health - one of the most vital and difficult challenges of the modern world."

මේක මීට පෙර විවෘත ආර්ථික කාරයින්ට වහකදුරු වුණ කථාවක්. වෙළඳපොල තුළ හැම දේම ඉබේම විසඳෙනව කියල අදහපු අයත් අද ලෝක ආණ්ඩුවක උවමනාව ගැන කථා කරනව.